# 11 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව - ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව (4 පාඩම)

## කියවීම් ද්‍රව්‍ය

- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ විශාලත්වය

> - 2012 වර්ෂයේ ජන සංඛ්‍යාව මිලියන 20.2 කි.
> - ජන ඝනත්වය වර්ග කිලෝමීටරයට පුද්ගලයන් 323 කි.
> - ප්‍රථම විධිමත් සංගණනය 1871 දී කර ඇත.
> - දකුණු ආසියාව සමග ජන සංඛ්‍යාවේ විශාලත්වය බලන විට ශ්‍රී ලංකාව 5 වන ස්ථානයේ ඇත.
> - සාමාන්‍ය වාර්ෂික ජනගහන වර්ධන වේගය 0.8 කි.

## <u>ජන සංඛ්‍යා වර්ධනය</u>

යම් නිශ්චිත භූමි ප්‍රමාණයක සිටින ජන සංඛ්‍යාව වැඩිවීම ජන සංඛ්‍යා වර්ධනයයි.

- ශ්‍රී ලංකාවේ 1871 සිට මේ දක්වා සියලු සංගණන වාර්තා අනුව ජන සංඛ්‍යාව නොකඩවා වර්ධනය වී ඇත.
- 2012 වන විට එය මිලියන 20.2ක් වී ඇත.
- ඉහළම ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකය වන 2.8% පැවතියේ 1953 වසරේ දීය.මෙම වර්ධනයේ අඩු වැඩි බව මෙම ප්‍රස්ථාරයෙන් පැහැදිලි ය.




4.2 ප්‍රස්තාරය - ජනසංඛ්‍යාවේ වාර්ෂික වර්ධන අනුපාතිකය

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012 අනුව සකස් කරන ලදි.

- ජන සංඛ්‍යා වර්ධන ශීඝ්‍රතාවන් වෙනස් වී ඇති ආකාරයන් වකවානු 3 ක් ඔස්සේ හඳුනාගත හැකිය.
  1. ක්‍රි.ව.1871 සිට 1946 ජන සංඛ්‍යාව ඉතා සෙමෙන් වර්ධනය වීම.
  2. ක්‍රි. ව. 1946 සිට 1953 දක්වා කාලයේ වේගවත් වර්ධනය
  3. ක්‍රි.ව. 1953 න් පසුව වර්ධනය ක්‍රමයෙන් අඩු වී යාම.

- 1953 න් පසුව ජන සංඛ්‍යා වර්ධනය පහළ බැසීමට හේතු -

  ස්වාභාවික වර්ධනය පහළ බැසීම.

  රටින් පිටතට සිදුවන සංක්‍රමණ

<u>ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රාදේශීය වෙනස්කම්</u>

වියළි කලාපයේ වාර්ෂික වර්ධනය ඉහලය. බස්නාහිර පළාතේ වැඩි ජන සංඛ්‍යා වර්ධනයක් ඇත.

තෙත් කලාපයේ නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කවල අඩු ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකයක් ඇත.

එසේම තෙත් කලාපයේ කොළඹ දිස්ත්‍රික්කයේ ඉහළ වර්ධනයක් ඇත.



<u>ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රාදේශීය වෙනස්කම් සඳහා උදාහරණ -</u>

| | |
|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කය - 1.33% | බදුල්ල දිස්ත්‍රික්කය - 0.39% |
| මොණරාගල දිස්ත්‍රික්කය - 1.15% | කළුතර දිස්ත්‍රික්කය - 1.23% |
| කොළඹ දිස්ත්‍රික්කය - 0.35 % | ගම්පහ දිස්ත්‍රික්කය - 1.02% |
| නුවරඑළිය දිස්ත්‍රික්කය - 0.05% | හම්බන්තොට දිස්ත්‍රික්කය - 1.17% |

## <u>ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය</u>

- ජන සංඛ්‍යාව අසම ලෙස ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වී ඇත.ඒ අනුව දිවයිනේ මුළු ජන සංඛ්‍යාවෙන් 28.8% බස්නාහිර පළාත තුළ ඒකරාශි වී ඇත.
- දිවයිනේ වැඩිම ජන සංඛ්‍යාවක් කොළඹ දිස්ත්‍රික්කය තුළ ඒකරාශි වී ඇති අතර 2012 සංගණනයට අනුව එම දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යාව 2,323,826 ක් වේ.
- මුළු ජන සංඛ්‍යාවෙන් 5.2% ක් පමණ අඩු ගණනක් උතුරු පළාත තුළ ඒකරාශි වී ඇත.
- ජන සංඛ්‍යාව අඩුම දිස්ත්‍රික්කය මුලතිව් වේ.(92,228 )
- මධ්‍යම(12.6%), දකුණ (12.2%) ,වයඹ ( 11.7%) පළාත්වල වැඩි ජන සංඛ්‍යාවක් ව්‍යාප්ත වී ඇත.
- සෑම දිස්ත්‍රික්කයකම ජන සංඛ්‍යාව මිලියනය ඉක්මවා ඇත.
- ග්‍රාමීය(77.3%) ,නාගරික(18.3%) , වතු (4.4%) ලෙස ජන සංඛ්‍යාව ව්‍යාප්ත වී තිබීම.

## කොළඹ දිස්ත්‍රික්කය තුළ වැඩි ජන සංඛ්‍යාවක් ඒකරාශි වීමට හේතු -

1. දිවයිනේ ප්‍රධාන වාණිජ හා පරිපාලන කටයුතු ඒකරාශි වී තිබීම.
2. අධ්‍යාපන කටයුතු හා සේවා ඒකරාශි වී තිබීම.
3. කොළඹ නගරයට පහසුවෙන් ළඟා වීමේ හැකියාව.
4. නිදහස් වෙළඳ කලාපවලට සිදුවන සංක්‍රමණ .
5. ආකර්ෂණ සාධක බහුල වීම.

## ජන සංයුතිය

- වාර්ගික ජන සංයුතිය ප්‍රධාන කාණ්ඩ 5 කි.




- ආගම් අනුව ජන සංඛ්‍යාව අනුවද කණ්ඩ 5කි.




- මේ අනුව විවිධ ජන වර්ග අප රට තුළ දැකිය හැකිය.

## ජන සංඛ්‍යා ව්‍යුහය

- මීට අයත් වන්නේ ජන සංඛ්‍යාවක් උපතින්ම උරුම කරගන්නා ව්‍යුහාත්මක ලක්ෂණයි.
    1. වයස් ව්‍යුහය
    2. පුමිතිරි බව
- වයස් කාණ්ඩ අනුව ජන සංඛ්‍යාව ආශ්‍රිත ව බාල වයස් කාණ්ඩවල ජන සංඛ්‍යාව අඩු වීම ද වියපත් ජන සංඛ්‍යාව වැඩි වීමද විශේෂ ලක්ෂණයකි .

ජන සංඛ්‍යාව වියපත් වීම යනු වයස අවුරුදු 59 ට වැඩි වැඩිමහල් යැපෙන්නන්ගේ සංඛ්‍යාව යි.

- වයස් කාණ්ඩ සහ පුමිතිරි බව අනුව ජන සංඛ්‍යාව ප්‍රමාණාත්මක වශයෙන් බලන විට මෙසේය.

<u>වයස් කාණ්ඩ අනුව</u> -

වයස අවු. 15 ට අඩු - 25.8%

වයස අවු.15 – 59 අතර - 62.0%

වයස අවු.60 ට වැඩි - 12.2%

<u>පුමිතිරි බව අනුව</u> -

පුරුෂ - 48.5%

ස්ත්‍රී - 51.5 %

- ජන සංඛ්‍යාව වියපත්වීම නිසා රටකට ඇතිවන බලපෑම් -
  1. ශ්‍රම බලකාය අඩුවීම.
  2. සුබ සාධක සේවාවන් ඉහළ යාම.
  3. ජාතික ආදායමේ ඉතුරුම් අඩුවීම.
  4. රටේ යැපෙන්නන් ප්‍රමාණය ඉහළ යාම.

- වයස් ව්‍යුහය සහ පුමිතිරි අනුපාතිකය අධ්‍යයනය කිරීමෙන් රටකට සැලසෙන වාසි.
  1. ශ්‍රම බලකාය හඳුනා ගත හැකි වීම.
  2. ප්‍රජනන වයසේ පසුවන ස්ත්‍රීන් හඳුනාගත හැකිවීම.
  3. යැපෙන්නන් සංඛ්‍යාව සොයාගත හැකිය.
  4. අනාගත ජන සංඛ්‍යා වර්ධන ප්‍රමාණයන් දැන ගත හැකිය.